ඔබට පෙර කිසිදු නබිවරයකුට පිරි නොනැමූ ආලෝකයන් දෙකක් පිළිබඳ ශුභාරංචි ලබා ගන්න. එනම් සූරා අල්ෆාතිහාව හා සූරා අල් බකරාහි අවසානයයි. ඒදෙකින් එක් අකුරක් හෝ පාරායනය කළේ නම් එය ඔහුට පිරිනමනවා මිස වෙනකක් නැතැ'යි පවසා සිටියේය

අබ්දුල්ලාහ් ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) විසින් ප්රකාශ කරන ලදී. "ජිබ්රීල් (අලයිහිස් සලාම්) තුමා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අබියස වාඩිවී සිටිය
දී තමන්ට ඉහළින් මතු වූ හඬකට සවන් දුන්නේය. පසුව තම හිස ඔසවා මෙසේ පැවසීය: "මෙය අහසින් වූ දොරටුවකි. අද දින එය ඇරී ඇත. අද හැර වෙනත් කිසිදු දිනයක එය ඇරී නැත. ඉන් මලක්වරයකු පහළ විය. එවිට ඔහු: 'මහපොළොව වෙත පහළ වූ මෙම සුරදූතයා අද දින හැර වෙනත් කිසිදු අවස්ථාවක පහළ වී නැත.' පසුව සලාම් පවසා මෙසේ පැවසීය: 'ඔබට පෙර කිසිදු
නබිවරයකුට පිරි නොනැමූ ආලෝකයන් දෙකක් පිළිබඳ ශුභාරංචි ලබා ගන්න. එනම් සූරා අල්ෆාතිහාව හා සූරා අල් බකරාහි අවසානයයි. ඒදෙකින් එක් අකුරක් හෝ පාරායනය කළේ නම්
එය ඔහුට පිරිනමනවා මිස වෙනකක් නැතැ'යි පවසා සිටියේය." [صحيح] [رواه مسلم]

ජිබ්රීල් (අලයිහිස් සලාම්) තුමා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අබියස වාඩිවී සිටිය දී දොරක් විවෘත කළ විට මතු වන හඬක් මෙන් අහසින් මතු වූ හඬකට සවන් දුන්නේය. පසුව ජිබ්රීල් (අලයිහිස් සලාම්) තම හිස ඔසවා අහස දෙස බලා පසුව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත මෙසේ පැවසීය: මෙය අහසින් වූ දොරටුවකි. අද දින එය ඇරී ඇත. අද හැර වෙනත් කිසිදු දිනයක එය ඇරී නැත. ඉන් සුරදූතයකු මහපොළොවට පහළ විය. එම සුරදූතයා අද දින හැර වෙනත් කිසිදු අවස්ථාවක පහළ වී නැත. පසුව එම මලක්වරයා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට සලාම් පවසා මෙසේ පැවසීය: ඔබට පෙර කිසිදු නබිවරයකුට පිරි නොනැමූ ආලෝකයන් දෙකක් පිළිබඳ ශුභාරංචි ලබා ගන්න. එනම් සූරා අල්ෆාතිහාව හා සූරා අල් බකරාහි අවසාන වැකි දෙකය. පසුව එම මලක්වරයා මෙසේ පැවසීය: 'ඒදෙකින් එක් අකුරක් හෝ පාරායනය කළේ නම් එය ඒ දෙකෙහි ඇති යහපත ප්රාර්ථනාව හා ඉල්ලීම ඔහුට පිරිනමනවා මිස වෙනකක් නැතැ'යි පවසා සිටියේය.

http://sunnah.global/hadeeth/si/show/5775